මනෝරාව

මෙල්බර්න් නුවර ''කලා පුරයක්'' වෙලා ය කියලා කවුරුත් කියනවා. කලා රසිකයන්ට විඳින්න අද අපේ දේ බොහෝමයි. ඒ අතරින් වඩාත් ඉස්මතු වෙලා පෙනෙන්නේ ගීත ප්‍රසංග. මේ පුරයේ අපත් සමග වෙසෙන ගීත කාමීන් ඉදිරිපත් කරන ප්‍රසංග වගේම මව් බිමේ අපේ ප්‍රවීණයන් ගෙන්වා ගෙන ඉදිරිපත් කරන ප්‍රසංග ප්‍රමාණය අවුරුදද්දෙන් අවුරුද්දම ඉහළ යනවා වගෙයි. ඒක ගීත රසිකයන්ට හොඳ ආරංචියක්. එකිනෙකට වෙනස් ප්‍රසංග අතරින් තමන් කැමති දේ තෝරා ගන්නටත් හොඳ අවස්ථාවක්.

මෙල්බර්න් ප්‍රසංග වේදිකාවේ ගායනයෙන් රසිකයන් ඇමතූ අපේ යොවනයෙක් මව්බිමේ ප්‍රවීණයන් ගෙන්වා ගෙන ඉදිරිපත් කිරීමට සුදානම් වන ගීත ප්‍රසංගයක් ගැනයි මේ කතිකාවත.

ගී ප්‍රසංගය නමින් ''මනෝරාව''
පැවැත් වෙන්නේ ජූලි මාසයේ 23 වෙනි සෙනසුරාදා සවස 6.30
ජෝර්ජ් වුඩ් පර්ෆෝමිං ආර්ට්ස් සෙන්ටර් ශාලාවේ දී
(GEORGE WOOD PERFORMING ARTS CENTER)

වික්ටෝරියානු ගායන ශිල්පි සංගමය එහෙමත් නැත්නම් වාස් (VAAS) සංවිධානය ඉදිරිපත් කරපු ''ගී සර ගී රස'' ප්‍රසංගයේ දී අප මුලින්ම ධනුෂ්ක ප්‍රනාන්දු යොවනයා හඳුනා ගත්තේ. ආකර්ෂණීය හඬකින් හයිමාකාරයෙන් ගායනය ඉදිරිපත් කරන තරුණයෙකු හැටියටයි අප ඔහුව හඳුන්වන්නේ. ඔහු මව් බිමේදීත් තිර්මාණ කටයුතු කළ බවත් සිංගප්පූරුවේ දී මියැසි නාක්ෂණය නැත්නම් මියුසික් ටෙක්නොලොජි හදාරපු බවයි අපට අහන්නට ලැබුණේ.

''මනෝරාව '' ප්‍රසංගය වෙනවෙන් ''සන්නස '' කතිකාවතට අප ධනුෂ්කව සම්බන්ධ කර ගත්තේ ඔහු එහි නිර්මාණාත්මක සංවිධායකවරයා වන නිසාය.

''අපි මුලින්ම මේ වාගේ ප්‍රසංගයක් කළේ මිට අවුරුදු එක හමාරකට විතර කලින්..... '' ධනුෂ්ක කතිකාවතට මුල පිරුවා.
''කවුද දැන් මේ ''අපි'' කියලා කියන්නේ ''
'' මනෝ සහ මම, මනෝට මෙහේ ව්‍යාපාර තියෙනවා. ව්‍යාපාරිකයෙක් වුණාට ඔහු කලාවට බොහෝම ලැදි කෙනෙක් '' ඒ ධනුෂ්ක තමාගේ සඟයාව හඳුන්වලා දුන්න ආකාරයයි.

මනෝ අමුණුගම රැකියා ආයතනයක් , සංචාරක සමාගමක් සහ ශ්‍රී ලාංකික ද්‍රව්‍ය ගෙන්වා අලෙවි කිරීමේ සමාගමක් මෙහි පවත්වා ගෙන යන බවයි ධනුෂ්ක අප සමග පැවසුවේ.

''ඉතින් මෙත් මේ ක්ෂේත්‍රයේ ඉන්න නිසා මෙහෙම දෙයක් කරමු ද කියලා මනෝ ඇහුවා . ඉතින් මටත් තියෙන දැන හැඳුනුම්කම් එක්ක හොඳ දෙයක් කරමු කියලා මාත් එකඟ වුණා''.

''පටන් ගන්න කොටම මනෝ කියපු දෙයක් තමා මෙහේ අවිත් ඉගෙන ගන්න සල්ලි නැති එහෙත් ඒ ගැන උනන්දු වෙන ළමයින්ට ශිෂ්‍යත්ව දෙන්න අරමුදලක් පිහිටවා ගන්න එක තමයි එයාගේ ඉලක්කය කියලා. ඉතින් ඒ ඉලක්කයට කවදා හරි යන්න ඕන කියන අරමුණින් අපි මුලින්ම ''ගිම්හාන රාත්‍රිය'' ප්‍රසංගය කළේ''. විශාරද නන්දා මාලිනියත් ටී. එම්. ජයරත්නයනුත්

සිසිර දිසානායක

සමගින් කළ ''ගිම්හාන රාත්‍රිය'' ප්‍රසංගයේ සංගීතය මෙහෙය වුයේ අප අතර වෙසෙන තරුපති මුණසිංහයන්ය. මින් පෙර නොවූ එකතුවක් වුණා ඒ එකතුව.

''මේ ශිල්පින් තෝරා ගන්න කොට මොන විදියටද හිතෙන්නේ''?
'' ඇත්තටම මුලින්ම අපට ඕන කළේ හොඳම දෙයක් කරන්න. ''ගිම්හාන රාත්‍රිය'' ගැන හිතනකොට අප මුලින්ම හිතුවේ පණ්ඩිත් අමරදේවයන් ගැනයි, විශාරද නන්දා මාලනි ගැනයි. ඒත් ඒ වෙලාවේ අමරදේවයන් අසනිප තත්ත්වයෙන් හිටපු නිසා තමයි ටී. එම්. ජයරත්න මහත්තයා ගැන හිතුවේ ''.

''මේ වතාවෙදිත් අප වික්ටර් රත්නායක , සුනිල් එදිරිසංහ වගේ ප්‍රවීණයෝ ගැන හිතුවා. ඒ වුණත් පහු ගිය අවුරුද්ද ඇතුළත ඒ අය වෙනත් මෙල්බර්න් ප්‍රසංග වලට ආව නිසා මේ වතාවේ ටී. එම්. ජයරත්න මහත්මයාව ම සහභාගි කරවා ගන්න හිතුවා. ගිය වතාවේ ඒ මහත්මයා අපිත් එක්ක සහදව කටයුතු කරපු විදිහත් ඒකට බලපෑවා''.
'' ටී. එම්. ජයරත්න කියන්නේ හැත්තෑවේ දශකයේ තාරුණ්‍ය අමතපු ප්‍රවීණයෙක්. ඉතින් අපි හිතුවා වර්තමානයේ තාරුණ්‍යයට කතා කරන ශිල්පිනියක් දායක කර ගන්න. ඒ නිසයි නිරෝෂා විරාජිනි ප්‍රවීණ ශිල්පිනියට ආරාධනා කළේ''.

මේ ප්‍රසංගයේ සංගීත අධ්‍යක්ෂනය මෙහෙයවීම වැනි දෝරයි ඉක්බිතිව අප යොමු වුයේ.
''ගිම්හාන රාත්‍රියට ලංකාවෙන් දායක වුණ සංගීත ශිල්පින් හතර දෙනා අතර සුරේෂ් මාලියද්ද ප්‍රවීණයාත් හිටියා. සුරේෂ් මාලියද්ද කියන්නේ අද ලංකාවේ ප්‍රසංග වේදිකාවේ ඉස්සරහින්ම ඉන්න අධ්‍යක්ෂවරයා කියලා කියන්න පුළුවන්. ඔහුත් අද තාරුණ්‍යයට කථා කරන්න පුළුවන්, ඒ වාගේම එදා තාරුණ්‍යය හඳුනන දක්ෂයෙක්. ඔහුගේ ඉල්ලීමට අනුව නිහාල් කළුබෝවිල ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පියාත් අපට ලංකාවෙන් එකතු වෙනවා. අනික් වාදන ශිල්පින් අපි අතරේ මෙහේ ඉන්න අය. ඒ අයව සම්බන්ධීකරණය කරන්නේ තිසර බණ්ඩාර කියන අපේ ගිතවත් වාදන ශිල්පියායි''.
''වේදිකාවේ පසු පස දේවල් වලට අපි අතරෙම ඉන්න දක්ෂයෝ පිරිසක් සහාය දෙනවා. ඒ අය ගැන වෙන වෙනම කියන්න මේ වෙලාවේ ඉඩක් නැති වුණාට අපි ඒ අයට ස්තූති වන්ත වෙන්න ඕන''.

මෙම ප්‍රසංගයේ ධනුෂ්කගේ කාර්ය භාරය සංවිධානය කිරීම පමණක්දැයි අපට සිතුණා.
''මුලිනම් කියන්න ඕන මනෝ ගැන. ඔහු තමයි මේ හැම දේකටම මූලාශ්‍රය දායකත්වය දරන්නේ. ඔහුගේ එම්. එන්. ඉවෙන්ට්ස් (එ. හ .සඞ්ඝමී)ආයතනය මගින් තමයි මේ ප්‍රසංගය සංවිධානය කරන්නේ. ඒකේ ප්‍රසංග සංවිධායක විදියටයි මම කටයුතු කරන්නේ . ඒ ඇරුණම නිරෝෂා විරාජිනි ශිල්පිනියට යුග ගායනයෙන් මම දායක වෙනවා. ගයනි පොල්ගම්පොළ සහෝදරිය තමයි ප්‍රචාරක කටයුතු වලින්, ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් අපට සහයෝගය දෙන්නේ. ''මනෝරාව '' කියන නම යෝජනා කළේ ද සංජීව අත්කරගම. ඔහු තමයි මේ ප්‍රසංගය මෙහෙය වන්නේ.
''මේ ප්‍රසංගය පැවැත් වෙන ජෝර්ජ් වුඩ් පර්ෆෝමිං ආර්ට්ස් සේනටර් එකේ ශාලාව ගැනත් යමක් කිව්වොත් හොඳයි කියලා හිතෙනවා. ගිය පාර බොහෑත් ශාලාවේ වෙච්ච අඩු පාඩුවත් හිතට අරගෙන ඒවා අවම කර ගන්න සුදුසු තැනක් අපි සෙවිවා. හැමදාමත් වෙනස් දෙයක් කරන්න හිතන නිසා මේ අළුත් තැනත් ප්‍රසංගය බලන්න එන අයට අළුත් අත්දැකීමක් වේවි. ඇත්තටම හොඳ ශාලාවක්. ඉදිරියට කෙරෙන අපේ ප්‍රසංග බොහෝමයක් මෙතෙන කෙරෙයි කියලා හිතෙනවා. කාර්ය මණ්ඩලයත් හරි නම්‍යශීලිය. ඒ වාගේම ප්‍රසංගය ඉදිරිපත් කරන කොටත් වෙනසක් කරලා බලන අයට වෙනසක් අත් විඳින්න සලස්වන්නයි අදහස''
මේ ආකාරයෙන් තමන්ගේ මුලික ඉලක්කය වන ශිෂ්‍යත්ව අරමුදල කරා යොමු වන්නේ කෙළෙසින්දැයි අප කතිකාවත නිමාවේ විමසිලිමත් වුවා.

'' ඇත්තටම මාතලේ රත්තොට ප්‍රදේශයේ ඉස්කෝලෙකට අප ගිය වතාවේ සැලකිය යුතු මුදලක් පිරිනැමුවා. සෙරප්පුවක්වත් නැතිව පාසල් එන ළමයින්ට පාවහන් දෙන්න සහ එයාලගේ ඉල්ලීමක් විදිහට ක්‍රීඩා පිටිටනිය සංවර්ධනය කරන්න ඒ මුදල යොදවුණා.
මනෝගේ අදහසක් වුනේ හැම ප්‍රසංගයකින්ම මව් බිමේ කාට හරි මොනවා හරි දෙයක් කරන්න ඕන කියන එක. ඒත් ඉතින් මේ ප්‍රසංග වල ප්‍රචාරක කටයුතු වලදි නම් අපි ඔය කාරණාව ඉස්සරහට දැම්මේ නැහැ.

අළුත් විදියේ ශිල්පි සංයෝගයකින් , අළුත් තැනක , අළුත් ආකාරයකින් ඉදිරිපත් කරන්නට සංවිධානය වන ''මනෝරාව'' ප්‍රසංගය නැරඹීමට ජෝර්ජ් වුඩ් පර්ෆෝමිං ආර්ට්ස් සෙන්ටර් එකට ජූලි 23 දා හවස 6.30 එක් වන ලෙසට ධනුෂ්ක සිය සංවිධායක මණ්ඩලය වෙනුවෙන් සියළු පාඨකයින් හා රසිකයන් වෙත ආරාධනා කළා .

මේ සහෘදයන්ගේ උත්සාහය සාර්ථක වේවායි අප ''සන්නස'' වෙනුවෙන් සුභ පතනවා.

33 වන පිටෙන්

නුහුරුය. වාතයේ හැවුම් බව, ජලයේ පැහැදිලි බව, අපට අයිති නැතිනම්, ඔබ ඒවා මිලදී ගන්නේ කෙසේද? මෙම භූමියේ සෑම කොටසක්ම මාගේ මිනිසුනට ශුද්ධ වස්තූන්ය. සෑම දිලිසෙන පයින් කටුවක්ම, සෑම වැලි තලාවක්ම, අඳුරු කැළෑ වල ඇති සෑම මිදුම් පටලයක්, පිරිසිදු හා ගුමු නාද දෙන සෑම කෘමියෙක්ම, මාගේ මිනිසුන්ගේ මතකයේ හා අත්දැකීම් තුල රැඳෙන ශුද්ධ වස්තූන්ය. වෘක්ෂ කඳන් තුල ගලා යන සාරය තුල රතු ඉන්දියානුවන්ගේ මතකයන් රැඳී පවතී.ල

1601 වර්ෂයේදී උතුරු ඇමරිකාවේ පළමු ඉංග්‍රීසි ජනපද බිහිවීමක් සමගම ඇමරිකා එක්සත් ජනපදයේ වහල්භාවය යන්නෙහි මූලාරම්භය ඇතිවිය. එම වහල්භාවය 1865 දක්වාම පැවතුනි. වහලුන් හට සලකන ලද්දේ මිනිසුන් නොව භාණ්ඩ ලෙසිනි. ඉතාම රළු තත්ත්වයන් යටතේ ඔවුනට වැඩ කිරීමට සිදු විය. වහල් වෙළඳපොළ තුළ පුරුෂයින් ඔවුන්ගේ භාර්යාවන්ගෙන් වෙන් කරන ලද අතර දරුවන්, මව්වරුන්ගෙන් වෙන් කරන ලදී. ඉතාම සුළු වරදකට පවා වහලුන්ට දරුණුවම් කරන ලද අතර, මෙම දරුණුවම් වලට සමූලඝාතනය කිරීම, පොලු මුගුරු වලින් පහර දීම හා සමහර විට ශරීරාංග ඉවත් කිරීමද අන්තර් ගත විය.

වියට්නාමයේදී හා ඉරාකයේදී සිදුකරන ලද මිලේච්ඡ ක්‍රියාවන් සම්බන්ධයෙන්ද ඇමෙරිකානුවන් විවේචයට පාත්‍ර වී තිබේ. වියට්නාම් යුද්ධයේදී ඇමෙරිකානුවන් නේපාම් බෝම්බ භාවිතය කළ බවට චෝදනා එල්ල වී ඇති අතර ඔවුන් විසින් අස්වැන්න විනාශ කිරීමද නිරායුධ සිවිල් වැසියන් ඝාතනය කිරීමද සිදු කොට ඇත. වියට්නාම් යුද්ධයේදී ඇමෙරිකානු හමුදා විසින් එක බස ගම්මානයේදී සිවිල් වැසියන් ගනනාවක් මරා දමන ලදී.

ඉරාකයේ සිවිල් වැසියන් මරණයට පත් වූ රටාව බලන කල අධි ආක්‍රමණශීලි ක්‍රමෝපායන්, ජනතාව ජීවත්ව සිටි ප්‍රදේශවල කල අවිචාරවත් කළ වෙඩි තැබීම්, ක්ෂණික මාරාන්තික බලයන් කෙරේ විශ්වාසය තැබීම ආදියෙන් බලකාමී රටාවක් පෙන්නුම් කෙරෙන බව 2003 මානව හිමිකම් අධීක්ෂණ වාර්තාව තුලින් හෙලි වේ. වාර්තාගතව ඇති සමහර ආරංචි මාර්ග වලින් හෙළිවනුයේ ඉරාකයේ සිවිල් වැසියන් 600, 000 කටත් වඩා මියගිය හා තුවාල ලද බවයි.

ඉතාලි ජාතිකයන් විසින් අප්‍රිකාවේ සිදුකරන ලද අපරාධ

1911 ඔක්තොම්බර් මාසයේදී ඉතාලි * තුර්කි යුද්ධයේදී අතිවිශාල සංඛ්‍යාවක් ගෝත්‍රික ස්ත්‍රී පුරුෂයන් හා ළමුන්ද ඝාතනය කරමින් ඉතාලි හමුදා විසින් උතුරු අප්‍රිකානු දේශසීමාවන් ආක්‍රමණය කරන ලදී. (වත්මන් ලිබියාව) දෙවනි ලෝක යුධ සමයේදී හා ඉන් පෙරද ලිබියාවේදී හා ඉතියෝපියාවේදී මුසෝලිනීගේ හමුදාව විසින් බොහෝ විට ස්වදේශිකයන්ට පහර දීම සඳහා යුද්ධ රැංකි, ගුවන් යානා හා
මස්ටර්ඩ් වායුද (රසායනික විෂ වායුවක්) භාවිතා කරන ලදී. 1929 * 1933 අතර කාලයේදී ඉතාලියානු පැසිස්ට්වාදීන් විසින් යටත් විජිත ලිබියාවේ නාසි *යුදෙව් සමූල ඝාතනයට පෙර දේශනපාලන සිරකරුවන් රඳවා තබන වද කඳවුරු ඉදිකරන ලදී. මෙම කඳවුරු වලදී පිරිමින් කායික වද හිංසා පමුණුවා, ස්ත්‍රීන් දූෂණය කොට, ළමුන් කුස ගින්නෙන් මිය යාමට ඉඩ හරින ලදී. ලිබියානු ගෝත්‍රික නායකයා වූ ඕමාර් මුක්තාර් ආක්‍රමණිකයන්ට විරුද්ධව නැගී සිට හොඳින් සන්නද්ධ වූ ඉතාලි හමුදාවට ප්‍රාථමික අවි ආයුධ යොදා ගනිමින් වසර 20 ක් තිස්සේ පැවති ගරිල්ලා යුද්ධයත් දියත් කළේය. ඔහුගේ නිදහස් සටන 1937 දී නිමාවට පත් විය. සටනකදී තුවාල ලද ඔහුව අල්ලාගෙන පසුව ඉතාලියානු හමුදාව විසින් මරු මුවට පත් කරන ලදී.

උතුරු අප්‍රිකාවේ බලෙන් අල්ලාගත් භූමි වල ඉතාලි * පැසිස්ට් හමුදාව විසින් සංවිධානාත්මක ලෙස ජනවාර්ගික සංහාරයක් කරගෙන යන ලදී. 1935 දී සිදු වූ ඉතාලියානු පැසිස්ට් ආක්‍රමණය හා අනතුරුව ඉතියෝපියාව අල්ලා ගැනීමේ කාලය තුල විවිධ මිලේච්ඡ ක්‍රියාවන් සිදු විය. ඉතාලි හමුදාවන් විසින් සිවිල් ඉලක්ක වලට මස්ටර්ඩ් වායුව යෙදූ අතර රෝහල් වලට හා ගම් වලට බෝම්බ හෙලමින් දසදහස් ගණනක් ජනයා මරුමුවට පත් කරන ලදී.

මතු සම්බන්ධයි